# මධ්‍යම පළාත් කෙටි නාට්‍ය උළෙල - 2021

ග්‍රීක පෞර රාජ්‍ය යුගය තෙක් ඉතා ඈත ඉතිහාසයකට උරුම කම් කියන වේදිකා නාට්‍ය කලාව සමාජ ජන ජීවිතයේ ක්‍රියාකාරකම් සමග සහ සම්බන්ධිතව ශත වර්ෂ ගණනාවක් පුරාවට පෝෂණය වී ගලාවිත් ඇත.ඒ මගින් ජන ජීවිතයේ එදිනෙදා මුහුණ දෙන සමාජ සංසිද්ධීන් පාදක කරගනිමින් චිත්තරූප ආවේගයන් දෙබස් තුලින් හා ආංගික අභිනයන් තුලින් විවිධ විෂයානු බද්ධ චරිත ඉදිරිපත් කිරීම් වල ප්‍රතිඵලය වූයේ නාට්‍ය කලාවේ බිහිවීමයි.

එදිනෙදා ජීවිතයේ සමාජ, ආර්ථික හා වෘත්තීය ගැටලු සමග අනවරත ජීවිත අරගලයක නිරත වන සමාජයේ මානසික පීඩනයන් මුදාහැරීමටත් වෙහෙස සංසිඳවා ගැනීමටත් එම සමාජ සංසිද්ධීන් පාදක කරගනිමින් කාලනුරූපීව විකාශනය වූ කලාඅංගයක් ලෙස වේදිකා නාට්‍ය කලාව හැඳින්වීමට පුලුවන.

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන කෙටි නාට්‍ය උළෙල මගින් අපේක්ෂා කරනුයේ ඈත ග්‍රීක නාට්‍ය කලාවෙන් පෝෂණය ලබා මෙරට බිහිවූ විදග්ධ නාට්‍ය අධ්‍යක්ෂකයින් අධ්‍යක්ෂණය කරන ලදුව සමාජ සම්භාවනාවට පාත්‍ර වූ අයුරින් අපේම නාට්‍ය කලාවක් පෝෂණය කිරීමට වෙර දරන නාට්‍ය අධ්‍යක්ෂණයේ නිරත වන අධ්‍යක්ෂකයින් ගේ උත්සහයට අත්වැලක් වෙමින් නාට්‍ය අධ්‍යක්ෂණයට උනන්දු කරවීමත් ආධුනික නාට්‍ය අධ්‍යක්ෂකයින් නාට්‍ය අධ්‍යක්ෂණයට යොමු කරවීමත් මගින් නව පරපුරක් මෙම ක්ෂේත්‍රයට බිහිකරවීමයි.

මෙම උත්තුංග අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පළාත් කෙටි නාට්‍ය උළෙල සංවිධානය කර ක්‍රියාත්මක කරනු ඇත.

කෙටිනාට්‍යක් ලෙස හඳුන්වන්නේ - නාට්‍යකට උචිත අනුභූතියක් පිටපත සඳහා තෝරාගැනීමෙන් පසු නාට්‍ය අධ්‍යක්ෂණයෙහි මූලිකාංග රැක ගනිමින් කරනු ලබන නිෂ්පාදනයයි. එය දිගු නාට්‍යයක කාලය කෙටි කර පෙන්වීමක් නොවිය යුතුය.

ඒ මගින් - උසස් රසඥතාවයන් අගයන ප්‍රෙක්ෂකාගාරයක් සඳහා අරුත්බර වේදිකා නාට්‍ය කලාවක් මධ්‍යම පළාත තුළ ඇති කරලීම අපේක්ෂා කෙරේ.

එම අරමුණ ඉටුකර ගැනීමෙන් -

01. පළාත තුළ පදිංචි වේදිකා නාට්‍ය කලාවට ලැදියාවක් ඇති නාට්‍ය අධ්‍යක්ෂකයින්හට වේදිකාවක් ලබාදීම.
02. රංගන කුසලතාවන් ඇති නවකයින් සඳහා රංග වේදිකාවක් ලබාදීම මගින් ඔවුන්ගේ කුසලතා එළිදැක්වීමට අවස්ථාවක් ලබාදීම.
03. ජුගුප්සාජනක වේදිකා නාට්‍ය කලාවක් වෙනුවට නිර්මාණාත්මක රසවින්දනයෙන් යුතු බුද්ධියට ආමන්ත්‍රණය කරනු ලබන නාට්‍ය කලාවක් ඇති කිරීම.
04. මධ්‍යම පළාතේ රංග ප්‍රතිභාවෙන්, රචනා හා අධ්‍යක්ෂණ ප්‍රතිභාවෙන් යුතු නවකයින් ජාතික තලයට හඳුන්වා දීමට අපේක්ෂිතය.

ක්‍රමවේදය -

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අයදුම්පත් හා කෙටිනාට්‍ය අත්පිටපත් ලබාගැනීම.
02. අත්පිටපත් පූර්ව විනිශ්චයට ලක්කර නිෂ්පාදනයට සුදුසු නාට්‍ය අත්පිටපත් තෝරා ගැනීම.
03. නාට්‍ය අධ්‍යක්ෂකයින්හට ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් මගින් පුහුණු වැඩමුලු පැවැත්වීම.
04. තෝරාගත් කෙටි නාට්‍ය තරඟාවලියට යොමුකර ජයග්‍රාහී නාට්‍ය තෝරා ගැනීම.
05. ජයග්‍රාහී නාට්‍ය හා ශිල්පීන් ඇගයීමට ලක්කිරීම.

ජයග්‍රහණය කරනු ලබන නිර්මාණ හා ශිල්පීන් සඳහා ( කුසලාන, සහතිකපත් හා මුදලින් ත්‍යාගය )

| | | |
|---|---|---|
| 01. | ප්‍රථම ස්ථානය | 35,000.00 |
| 02. | දෙවන ස්ථානය | 30,000.00 |
| 03. | තෙවන ස්ථානය | 25,000.00 |
| 04. | හොඳම නළුවා | 10,000.00 |
| 05. | හොඳම නිළිය | 10,000.00 |
| 06. | හොඳම සහායක නළුවා | 8,000.00 |
| 07. | හොඳම සහායක නිළිය | 8,000.00 |
| 08. | හොඳම අධ්‍යක්ෂණය | 8,000.00 |
| 09. | හොඳම රචනය | 8,000.00 |
| 10. | හොඳම රංගාලෝකය | 8,000.00 |
| 11. | හොඳම රංගවස්ත්‍ර නිර්මාණය | 8,000.00 |
| 12. | හොඳම රංග භූමි අලංකරණය | 8,000.00 |
| 13. | හොඳම අංගරචනය | 8,000.00 |
| 14. | හොඳමවේදිකා පරිපාලනය | 8,000.00 |
| 15. | හොඳම සංගීත නිර්මාණය | 8,000.00 |

කුසලතා ජයග්‍රහණ සඳහා ( සහතිකපත් හා මුදල් ත්‍යාගය )

| | | |
|---|---|---|
| 01. | හතරවන ස්ථානය | 20,000.00 |
| 02. | පස්වන ස්ථානය | 20,000.00 |
| 03. | හයවන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා ( 15,000 x 5 ) | 75,000.00 |
| 04. | ජයග්‍රහණ නොලබන කණ්ඩායම් සඳහා සහභාගිත්වය වෙනුවෙන් ( 7500 x 10 ) | 75,000.00 |

වශයෙන් මුදල් ත්‍යාග ,සහතිකපත්,හා කුසලාන පිරිනැමීම සිදුකෙරේ.

තරඟ කොන්දේසි

01. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවන් සහ පළාත තුළ පිහිටි උසස් අධ්‍යාපන ආයතන,විද්‍යා පීඨ,කාර්මික විද්‍යාල,තාක්ෂණික විද්‍යාල ,ගුරු අභ්‍යාස විද්‍යාල,තරුණසේවා සභා හා යෞවන සමාජ වලට ඉදිරිපත් විය හැකිය.
02. ස්ථිර පදිංචි අයදුම්කරුවන් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරීගේ සහතිකය සහිතව හා අනෙකුත් ආයතන වල අයදුම්කරුවන් ආයතන ප්‍රධානියාගේ සහතිකය සහිතව අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.
03. අයදුම්කරු නාට්‍යයේ අධ්‍යක්ෂක විය යුතු අතර ඔහු /ඇය නාට්‍ය රචකයා නොවන්නේ නම් රචකයාගේ පූර්ව අවසරය ලබාගත් ලිපියක් අයදුම් පත්‍රයට ඇමිණිය යුතුය.
04. කිසියම් ආගමක්,ජාතියක්,පුද්ගලයෙක්,දේශපාලන පක්ෂයක් හෝ ආයතනයක් විවේචනය නොවන ලෙස තමන් අභිමත තේමාවක් යටතේ සියලුම සාමාජිකයින් 30 කින් යුතුව අවම විනාඩි 15 කට හා විනාඩි 25 ක උපරිම කාලයකට යටත්ව අසභ්‍ය රංගන,වදන් හා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ රංගන ඇතුලත් නොවන නිර්මාණයක් විය යුතු අතර තරඟ කරුවන් ස්වකීය නමින්ම ඉදිරිපත් විය යුතුය.
05. කුමන හෝ ආකාරයේ රාජ්‍ය නාට්‍ය උත්සවයකට ඉදිරිපත් කර ජයග්‍රහණය නොකල , A4 ප්‍රමාණයේ තනි පිටුවේ පරිගණකගත කර හෝ පැහැදිලි අත්අකුරින් ලියන ලද අත්පිටපත් 04 කින් යුතුව අයදුම් පත්‍රයේ හැර අත්පිටපතේ කිසිඳු තැනක පුද්ගල නාම සඳහන් නොකල අත්පිටපත්, කතා සාරාංශය , නාට්‍ය දෘෂ්ටිය, චරිත විග්‍රහය සමඟ 2021.04.30 දිනට පෙර අධ්‍යක්ෂ,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,යටිනුවර වීදිය,මහනුවර. ලිපිනයට අතින් හෝ තැපෑලෙන් එවිය යුතුය.ලිපි කවරය ඉහල වම් පස කෙලවරේ කෙටි නාට්‍ය උළෙල 2021 සඳහන් කල යුතුය. මෙසේ නොමැති අත්පිටපත් අන්තර්ගතය නොසලකා ප්‍රතික්ෂේප කරනු ඇත.
06. ලැබෙන අත් පිටපත් අතරින් හොඳම අත් පිටපත් තෝරා නිෂ්පාදනය කරනු ලබන අත් පිටපත් සංඛ්‍යාව තීරණය කරන අතර නිෂ්පාදනය කරනු ලබන නාට්‍ය මූලික විමර්ශනයකට මෙම දෙපාර්තමේන්තුව මඟින් ලක් කරනු ඇත.

07. සාවද්‍ය තොරතුරු සපයා ඇති ,ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති,විනිශ්චය මණ්ඩල කටයුතු වලට බාධා කෙරෙන,කෙටි නාට්‍ය උළලේ කටයුතු වලට බාධාකරන, තරඟාවලියට ඉදිරිපත් වී සිටින කුමන ආකාර ශිල්පියෙකුට හෝ ශිල්පිනියකට අනර්ථයක් සිදුකරන කවරෙකුට හෝ මෙම තරඟාවලියෙන් කුමන හෝ අවස්ථාවක ඉවත් කිරීමට හෝ තිළිණ සම්මාන සහතික ප්‍රදානය සඳහා සලකා බැලීම පිළිබඳ අවසන් තීරණය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා සතුවේ.

08. තෝරාගනු ලබන අත්පිටපත් සංඛ්‍යාව අනුව, නිෂ්පාදනය කරනු ලබන නාට්‍ය අතර තරඟාවලිය ක්‍රියාත්මක කරන අතර තරඟාවලිය සඳහා ඉදිරිපත් වී ඇති නට්‍ය පිළිබඳව විරෝධතා තරඟ අවස්ථාවේ ඉදිරිපත් කල යුතුය. ඉන් පසු කරනු ලබන විරෝධතා නොසලකා හැර , ජයග්‍රාහී නාට්‍ය සඳහා  ත්‍යාග සම්මාන හා කුසලාන ප්‍රදානයට කටයුතු කිරීමටත් තරඟ පවත්වන දිනය ස්ථානය වේලාව දන්වා සිටියදීත් තරඟයට ඉදිරිපත් නොවන නාට්‍ය ස්ව කැමැත්තෙන් ඉවත්වූවා සේ සලකා කටයුතු කිරීමටත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට බලය ඇත.

09. විනිශ්චය මණ්ඩල තීරණය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂගේ අනුමැතියෙන් අවසන් තීරණය බවට පත්වන අතර ත්‍යාග සම්මාන කුසලාන පිරිනැමීම පිළිබඳව හා තරඟාවලිය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවත් ව්‍යවස්ථා සංශෝධන පිළිබඳවත් අවසන් තීරණ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ. ජයග්‍රාහී නාට්‍යය සම්මාන උත්සවයේ දී ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන අතර එය උත්සවයේ කටයුතු වලට බාධාවක් නොවන ලෙස කල යුතුය.

10. නාට්‍ය උළෙලට පෙර අවසන් තරඟ ප්‍රතිඵල ප්‍රකාශයට පත් නොකරන අතර හොඳම නාට්‍ය අත්පිටපත් අතරට නොතේරුන අත්පිටපත් පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට අවස්ථාව ඇත.

අයදුම්පත්

# මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර
# මධ්‍යම පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල  පළාත් සංස්කෘතික නිළධාරි
# මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ( www.culture.cp.gov.lk )

වෙතින් ලබාගත හැකිය.

ස්වර්ණා පෙරේරා,
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
යටිනුවර වීදිය,මහනුවර.

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
කෙටි නාට්‍ය තරඟාවලිය 2021 අයදුම්පත්‍රය

01. අයදුම් කරුගේ නම ( අධ්‍යක්ෂ ) ------------------------------------------------------------------------
02. ලිපිනය ------------------------------------------------------------------------------------------------------
03. හැඳුනුම්පත් අංකය ------------------------------------------------------------------------------------------
04. **ඊ මේල් ලිපිනය** ---------------------------------------------------------------------------------------------
05. **දුරකතන අංක ජංගම**------------------------------------- **නිවස** ------------------------------------------
06. **නාට්‍යයේ නම** -------------------------------------------------------------------------------------------------
07. **නාට්‍ය රචකයාගේ නම** ----------------------------------------------------------------------------------------
08. **ලිපිනය** -------------------------------------------------------------------------------------------------------
09. දුරකතන අංකය ජංගම --------------------------------- නිවස ------------------------------------------
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ---------------------------------------------------------------------------

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මාගේ නාට්‍යය නට්‍ය උළෙලට තෝරාගනු ලැබුව හොත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රදර්ශනය කිරීමටත්, මාවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ ව්‍යවස්ථාවේ කරුණු උල්ලංඝනය කිරීමක් සිදුවී ඇති බව අනාවරණය වන කුමන අවස්ථාවකදී හෝ මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තු කෙටි නාට්‍ය තරඟාවලියෙන් ඉවත් කිරීමට අයිතිය ඇති බව පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

............................... ................................................
දිනය - අත්සන

------------------------------------------------------------------------------------------------------

**උසස් අධ්‍යාපන ආයතන /විද්‍යා පීඨ / කාර්මික විද්‍යාල / තාක්ෂණික විද්‍යාල /ගුරු අභ්‍යාස විද්‍යාල /තරුණ සේවා සහ යෞවන සමාජ අයදුම්කරුවන් සඳහා**

මෙම නිර්මාණය ඉහත නම සඳහන් ..........................................................................................

මයා / මිය / මෙනවිය / ශිෂ්‍යයා /ශිෂ්‍යාව ගේ නිර්මාණයක් බවත් ඔහු /ඇය මෙම ආයතනයේ / යෞවන සමාජයේ සාමාජිකයෙකු /සාමාජිකාවක බවත් සහතික කරමි.

............................. .......................................... ...................................
දිනය නිලමුද්‍රාව අත්සන
( ආයතන ප්‍රධානියාගේ / යෞවන සමාජ සභාපති/ ලේකම් )

------------------------------------------------------------------------------------------------------

පළාත් සංස්කෘතික නිළධාරි නිර්දේශය

පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,

------------------------------------------------ නම සඳහන් මෙම අයදුම්කරු /කාරිය ----------------------- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ---------------------------- ග්‍රාම නිළධාරි වසමේ පදිංචි අයකු බව සහතික කරමි.

දිනය - අත්සන - නිලමුද්‍රාව -